# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2486/16 - 2026 අප්‍රේල් මස 29 වැනි බදාදා - 2026.04.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත පරිදි නියෝග කරමි :-

1. මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධනවල 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවමි.

2. ජාත්‍යන්තර තලයේ ශ්‍රී ලංකාවේ කීර්තිය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් සංවර්ධනයේ වැදගත්කම හඳුනාගනිමින්; ක්‍රිකට් ක්‍රීඩාවේ පාලනය සහ පරිපාලනය තුළ අඛණ්ඩතාව, විනිවිදභාවය, සමානාත්මතාවය සහ වගවීම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමේ කාලීන අවශ්‍යතාවය පිළිගනිමින්; මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධනවල 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, ක්‍රීඩාවේ හා එයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තනය කිරීම සඳහා, පහත සාමාජිකයින්ගෙන් සමන්විත ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව (**SRI LANKA CRICKET TRANSFORMATION COMMITTEE**) මෙයින් පත් කරමි.

   1. ඉරාන් වික්‍රමරත්න මහතා - සභාපති
   2. සිදත් වෙත්තිමුණි මහතා
   3. රොශාන් මහනාම මහතා
   4. කුමාර් සංගක්කාර මහතා
   5. ප්‍රකාශ් ශාෆ්ටර් මහතා
   6. අවන්ති කොළඹගේ මහත්මිය
   7. තුශිර රදැල්ල මහතා
   8. ජනාධිපති නීතිඥ ඩිනාල් පිල්ප්ස් මහතා
   9. ජනාධිපති නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතා

1A - G 46718 — 04 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මම මෙයින්, ශ්‍රී ලංකා ක්‍රිකට් වාර්ෂික මහ සභා රැස්වීමක දී සිය නිලධාරින් තෝරා පත්කරගන්නා තෙක්, ශ්‍රී ලංකා ක්‍රිකට්හි කාර්යයන් කරගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඉහත කී ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව (**SRI LANKA CRICKET TRANSFORMATION COMMITTEE**) වෙත බලය පවරා දෙමි.

**සුනිල් කුමාර ගමගේ** (පා.ම.)
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2026 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0249

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.